## III මහ බැංකුවේ කටයුතු සහ ගිණුම්

1974 වර්ෂය සඳහා මහ බැංකුවේ මුදල් ගිණුම, III පරිශිෂ්ඨයෙහි 19 වැනි සංඛ්‍යා සටහනින් ඉදිරිපත් කෙරේ. 1973 වසර හා සසඳන කළ 1974 දෙසැම්බර් අගදී දක්නට ලැබුණු ප්‍රධාන වෙනස්කම් වූයේ:

| | වෙනස (රුපියල් දශලක්ෂ) |
|---|---|
| මුළු ඉල්ලුම් වගකීම් .. .. .. | + 356·2 |
| ව්‍යවහාර මුදල් සංසරණය .. .. .. | + 176·0 |
| ඉල්ලුම් තැන්පතු .. .. .. | + 163·5 |
| විදේශීය ණය ගැනීම් .. .. .. | + 16·7 |
| ජාත්‍යන්තර සංචිතය .. .. .. | − 60·5 |
| දේශීය වත්කම් .. .. .. | + 545·9 |

\+ වැඩිවීම − අඩුවීම

වර්ෂය අගදී රන්පවුම, ඉන්දියානු රුපියල් හා එක්සත් ජනපද ඩොලර් සඳහා වූ මහබැංකු අනුපාතිකයන් මෙසේය:–

| | | විදුලිය පැවරුම් මගින් මිලට ගැනීම | විදුලිය පැවරුම් මගින් විකිණීම |
|---|---|---|---|
| රන් පවුම් (සියයකට) | තැන් ඉදිරි (සමස දක්වා) | රුපියල් 1559 7/8 මසකට තැන් මිලෙන් රුපියලකට 21/32 ක් වට්ටම් කොට | රුපියල් 1561 3/8 මසකට තැන් මිලෙන් රුපියලකට 21/32 ක අධිමිලක් ඇතිව |
| ඉන්දියානු රුපියල් (සියයකට) | තැන් ඉදිරි (සමස දක්වා) | රුපියල් 82 15/16 මසකට තැන් මිලෙන් රුපියලකට 1/32 ක් වට්ටම් කොට. | රුපියල් 83/= මසකට තැන් මිලෙන් රුපියලකට 1/32 ක අධිමිලක් ඇතිව. |
| එ. ජ. ඩොලර් | තැන් ඉදිරි (තෙමස දක්වා) * | රුපියල් 668·70 රුපියල් 668·70 | රුපියල් 668·95 මසකට තැන් මිලෙන් ශත 50 ක අධිමිලක් ඇතිව. |

* තෙමසකට වැඩි හා සමස දක්වා වන කාලසීමාවන් සඳහා මහබැංකුව වෙත ඉදිරිපත් කරන විශේෂ ඉල්ලීමක් පිට

මහ බැංකුවේ විදේශ විනිමය ගණුදෙනු III පරිශිෂ්ඨයෙහි 24 වැනි සංඛ්‍යා සටහනින් දක්වේ.

රජයේ සුරැකුම් පත් සහ වාණිජ සහ නිෂ්පාදන අරමුණු හා සම්බන්ධ භාවිතීය පොරොන්දු නෝට්ටු ඇපයට තබාගෙන දෙනු ලබන අත්තිකාරම් සඳහා වන මහබැංකු පොළී අනුපාතිකය වාර්ෂිකව සියයට 6½ මට්ටමේම නොවෙනස්ව පැවතුණි. සහතික මිල ක්‍රමය යටතේ වී මිලයට ගැනීම සහ දේශීයව වගා කරන ලද කෘෂිකාර්මික ද්‍රව්‍ය මිලදී ගැනීම, විකිණීම හෝ ගබඩා කිරීම සඳහා මුදල් සැපයීම් වශයෙන් සමුපකාර සමිති වලට දෙනලද අත්තිකාරම් සඳහා වන පොරොන්දු නෝට්ටු ඇපයට තබාගෙන මහබැංකුව විසින් වෙළඳ බැංකු වලට දෙන අත්තිකාරම් වලට පොලිය 3% මට්ටමේ නොවෙනස්ව පැවතුණි. වී, එළවළු හා අනෙකුත් විශේෂිත භෝග වර්ග නිෂ්පාදනය හා සම්බන්ධව සමුපකාර සමිතිවල භාවිතීය පොරොන්දු නෝට්ටු ඇපයට තබාගෙන මහබැංකුව විසින් වෙළඳ බැංකුවලට දෙනු ලබන අත්තිකාරම් සඳහා වූ පොලී අනුපාතිකය සියයට 1½ ක්ව නොවෙනස්ව පැවතුණි. එසේ වුවද මෙම පහසුකම ලබන වෙළඳ බැංකු එකී පොරොන්දු නෝට්ටු නිකුත් කළ අයගෙන් වර්ෂයකට සියයට 8 කට (නියමිත දිනට බේරුම් කළහොත් සියයට 3 ක ප්‍රතිදානයකට යටත්ව) වඩා වැඩි පොළියක් අය නො කළ යුතුය. භාණ්ඩාගාර බිල්පත් සඳහා මහබැංකු වට්ටම් අනුපාතිකය අන්තිමට පිළිගත් සාමාන්‍ය ටෙන්ඩර් අනුපාතිකයට වඩා වර්ෂයකට සියයට 1/8 කින් වැඩිව තවදුරටත් පැවතුණි.

**විදේශීය මුදල් නෝට්ටු :**

නියමිත විනිමය අනුපාතිකයනට අනුව ශ්‍රී ලංකාවේ කටයුතු කරන වෙළඳ බැංකු වලින් විශේෂිත විදේශීය නෝට්ටු වර්ග මිලදී ගැනීම සහ ඒවාට එම නෝට්ටු විකිණීම මහබැංකුව විසින් තවදුරටත් කරගෙන යන ලදී.

**ණය සඳහා ඇපවීමේ වැඩ පිළිවෙල :**

1974 දී වී, එළවළු සහ අනෙකුත් විශේෂිත භෝග වර්ග වගාකිරීම සඳහා වෙළඳ බැංකු විසින් දෙන ලද රුපියල් 18,52,25,000/= ක ණය සඳහා මහබැංකුව ඇපවිය.

**මැදි හා දිගුකාලීන ණය :**

මැදි හා දිගුකාලීන ණය වැඩ පිළිවෙල යටතේ ණයදෙන ආයතනයන්ට මහබැංකුව විසින් දෙන ලද ප්‍රතිමූල්‍ය ණය සඳහා පොළී අනුපාතිකයන් පහත දැක්වෙන පරිදි නො වෙනස්ව පැවතුණි

(අ) කෘෂිකර්මය හෝ .කර්මාන්ත නගාසිටුවීම හෝ සංවර්ධනය සඳහා වර්ෂයකට සියයට 6½ ක්.

(ආ) තේ කම්හල් නවීකරණය හා නව කම්හල් ඉදිකිරීම සඳහා (තේ පාලක විසින් එවැනි ණය සඳහා ගෙවිය යුතු පොළියෙන් කොටසක් ගෙවන අවස්ථාවන් හිදී)

(I) දේශීය වියදම් සඳහා සියයට 6 ක්,

(II) විදේශීය විනිමය වියදම් සඳහා සියයට 8 ක්,

(ඇ) වෙළඳ, වාණිජ හෝ ව්‍යාපාරික කටයුතු නගාසිටුවීම හා සංවර්ධනය සඳහා වර්ෂයකට සියයට 7½ ක්,

රුපියල් 89,45,000/= ක ප්‍රතිමූල්‍ය ණය වසර තුළදී ණය දෙන ආයතනයන්ට ප්‍රදානය කරනු ලැබීය.

**ව්‍යවහාර මුදල් නිකුතුව :**

1974 අගදී මුළු ව්‍යවහාර මුදල් සංසරණය රුපියල් 18,290 ලක්ෂයක් විය. මෙය 1973 අග තත්ත්වය හා සසඳන විට රුපියල් 1,760 ලක්ෂයක වැඩිවීමක් පෙන්වයි. ව්‍යවහාර මුදල් නෝට්ටු සංසරණයෙහි රුපියල් 1,679 ලක්ෂයක වැඩිවීමක් හා කාසි සංසරණයෙහි රුපියල් 81 ලක්ෂයක වැඩිවීමක් දක්නට ලැබුණි. රුපියල් 100 නෝට්ටු විමූල්‍යනය කිරීම තුලින් ව්‍යවහාර මුදල් නෝට්ටු සංසරණයෙහි වැඩිවීම පෙන්නුම් කළ අතර අනිකුත් වටිනාකම් ගන්නා මුදල් නෝට්ටු බොහෝ දුරට ස්ථාවරව පැවතුණි.

**බැංකු හර බද්ද :**

බැංකු හර බද්ද එකතු කිරීම තව දුරටත් මහබැංකුව වෙත පැවරුණි.

**අනිවාර්ය ඉතිරි කිරීම :**

1971 අංක 6 දරන අනිවාර්ය ඉතිරි කිරීම් පනත සහ 1972 අංක. 15 දරන ආදායම් උපරිම හා අනිවාර්ය ඉතිරි කිරීම් නීතිය යටතේ එකතු කරන ලද මුදල් වල භාරකරු වශයෙන් මහ බැංකුව තව දුරටත් ක්‍රියා කළ අතර රජය වෙනුවෙන් අනිවාර්ය ඉතිරිකිරීම් අරමුදල පරිපාලනය කළේය.

**විදේශ විනිමය හිමිකම් සහතික පත් වැඩ පිළිවෙල :**

රජය වෙනුවෙන් මහබැංකුව විසින් විදේශ විනිමය හිමිකම් සහතිකපත් අරමුදල පරිපාලනය කිරීම තවදුරටත් කරගෙන යන ලදී.

**ආදායම සහ වියදම :**

වර්ෂය සඳහා මහබැංකුවේ ආදායම රුපියල් 13,19,67,000 ක් වූ අතර සංචිතයන් සඳහා වෙන්කිරීම සහ භූමියේ හා ගොඩනැගිලි වල වටිනාකම් වෙනුවෙන් ක්ෂය වීම සඳහා වූ ප්‍රතිපාදනය ද ඇතුළත්ව වියදම රුපියල් 13,09,67,000 ක් විය. මූල්‍ය නීති පනතේ 39 (ආ) වගන්තිය අනුව ශුද්ධ ලාභය වූ රුපියල් 10,00,000 අතිරික්තයට එකතු කරනු ලැබීය.

**බැංකු පරිපාලනය :**

මුදල් නීති පනතේ 29 (1) වගන්තිය යටතේ බැංකු පරිපාලන දෙපාර්තමේන්තුව විසින් 1974 වර්ෂයේදී වෙළඳ බැංකු අටක් පරීක්ෂණ කටයුතු ආරම්භ කළ අතර, වර්ෂය තුළදී ඉන් හතරක කටයුතු අවසන් කරනු ලැබීය.

1970 අංක. 27 දරන බැංකු හරබදු ආඥා පනත යටතේ පරිපාලනය හා සම්බන්ධ කටයුතු මෙම දෙපාර්තමේන්තුව විසින් දිගටම කරගෙන යන ලද අතර පනතේ 15 (1) වගන්තිය යටතේ, බලය ලත් නිලධාරියාගේ සහතික මගින් සැපයිය යුතු තොරතුරු වල නිරවද්‍යතාවය පරීක්ෂා කිරීමේ අරමුණ ඇතිව, වෙළඳ බැංකු පරීක්ෂා කිරීම කරගෙන යන ලදී.

**සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව**

මේ දක්වා බැංකු පරිපාලන දෙපාර්තමේන්තුවෙහි අංශයක් ලෙස පැවති, සංවර්ධන මූල්‍ය අංශයෙහි සේවකයන් හා කාර්‍ය භාරය ද 1974 ජනවාරි මාසයේදී පිහිටුවන ලද සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව විසින් පවරා ගන්නා ලදී. මෙම අළුත් දෙපාර්තමේන්තුවෙහි ප්‍රධාන කර්තව්‍යය වන්නේ මහ බැංකුව විසින් ප්‍රතිමූල්‍ය සපයන පෞද්ගලික අංශයෙහි සංවර්ධන යෝජනා ක්‍රම විභාග කර බැලීමත්, අගය කිරීමත්ය. රජයේ දෙපාර්තමේන්තු හා අමාත්‍යාංශ විසින් කරනු ලබන ඉල්ලුම් මත පොදු අංශයේ යෝජනා ක්‍රම විමසීම ද මෙම දෙපාතීමේන්තුවේ වගකීමය. 1974 වර්ෂයේදී බැංකු විසින් ගන්නා ලද ප්‍රති මූල්‍ය පහසුකම් අතර සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව විසින් මුදල් සපයන ලද්ද වූත්, ආසියා සංවර්ධන බැංකුවේ තේ කර්මාන්ත ශාලා නවීකරණ ණය ක්‍රමය යටතේ වූ, කම්හල් නවීකරණ සැලැස්ම ශ්‍රී ලංකා මහ බැංකුවේ නියෝජ්‍ය අධිපතිගේ සභාපතිත්වයෙන් යුත් කමිටුවකින් පාලනය වේ. මේ වනවිට ආසියා සංවර්ධන බැංකුවේ තේ කර්මාන්ත ශාලා නවීකරණය ක්‍රමය යටතේ වූ දෙවන ණය සම්පූර්ණයෙන්ම ලබා දී ඇති අතර තුන්වන ණයක් සඳහා ද ආයාචනයක් ඉදිරිපත් කර ඇත්තේය මෙම ආයාචනය සම්බන්ධ වූ මූලික කටයුතු දෙපාර්තමේන්තුව විසින් අවසන් කර ඇති අතර, ඒ සම්බන්ධ දිවයිනේ තියළුම ලියාපදිංචි කළ තේ කර්මාන්ත ශාලාවල යන්ත්‍ර උපකරණ ආදියෙහි ආයු කාලය පිළිබඳ විමර්ශනයක් ද කර ඇත.

මුදල් නීති පනතෙහි 108 වෙනි ඡේදයට අනුව ශ්‍රී ලංකා මහ බැංකුව, රජය වෙනුවෙන් ක්‍රියා කරමින්, 1967 සිට මහජන බැංකුව විසින් සපයන ලද මූල්‍යමය ආධාර වී, එලවලු හා අතිකුත් නියමිත භෝග සඳහා ද වගා ණය සහතික කිරීම් ක්‍රමයක් යටතේ ක්‍රියාත්මක කළේය. 1974 සිට ලංකා බැංකුව විසින් දෙනු ලබන වගා ණය ද මෙම ක්‍රමය යටතට ගෙනෙන ලද අතර, හැටන් නැෂනල් බැංකුව විසින් පහළ ඌව-දෙබර ආරු වැව යෝජනා ක්‍රමය යටතේ පදිංචි කරන ලද ගොවීන්ට දෙන ණය ද සහතික කරන ලදී.

වාණිජ බැංකු විසින් තේ කර්මාන්තය සඳහා දෙනු ලබන මධ්‍ය හා දිගු කාලීන ණයට පහසුකම් සැලසීම සඳහා සැලසුම් කළ ණය සහතික ක්‍රමයක් 1974 මාර්තු මාසයේ සිට රජය වෙනුවෙන් ආරම්භ කරන ලදී. එකී ණය සහතික ක්‍රමය 1974 ඉංදු-ලංකා ගිවිසුම යටතේ ආපසු සියරට බලා යන ඉන්දියානුවන්ට වාණිජ බැංකු මගින් දෙනු ලබන ගෙවීම් සඳහා ද 1974 අගෝස්තු මාසයේ සිට පුළුල් කරන ලදී. වාණිජ බැංකු මගින් සුළු ව්‍යාපාර සඳහා

දෙනු ලබන ණය, සහතික කිරීමෙ වරම මුදල් නීති පනතෙහි 108 A ඡේදය යටතේ මහ බැංකුවට පැවරුන අතර, එය 1974 සිට ක්‍රියාත්මක විය. එහෙත් මෙම ක්‍රමය යටතේ ණය 1974 අවසානය වන තුරුම දී තිබුණේ නැත.

කිරි සඳහා ගවයන් ඇතිකිරීම සංවර්ධනය කිරීමේ යෝජනා ක්‍රමයට සම්බන්ධ වූ වාණිජ බැංකුවල පරිපාලන නිලධාරීන් සඳහා පුහුණු කිරීමේ පාඨමාලවක් 1974 සැප්තැම්බර්වලදී මෙම දෙපාර්තමේන්තුව විසින් මෙහෙයවන ලදී. මේ සඳහා දරූ විදේශ විනිමය හා දේශීය පිරිවැයෙන් කොටසක් ජාත්‍යන්තර සංවර්ධනයට ලැබින. මෙම පුහුණුවීමේ පාඨ මාලාව සැලසුම ක්‍රියාත්මක කිරීමේ ලේකම්වරයාගේ සභාපතිත්වයෙන් යුතු කමිටුවක් යටතේ ප්‍රාථමික වැඩ කටයුතු ක්‍රියාත්මක කරන ලදී. සංවර්ධන මූල්‍ය අධ්‍යක්ෂකවරයාද මෙම කමිටුවෙහි සාමාජිකත්වය දැරීය.